## මාර්ග ආරක්ෂාව පිළිබඳ ජාතික සභාව - 2013

මාර්ග ආරක්ෂාව පිළිබඳ ජාතික සභාවේ 2013 දෙසැම්බර් 31 දිනට ශේෂ පත්‍රය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා ආදායම් හා වියදම් ප්‍රකාශනය, ස්කන්ධය වෙනස්වීමේ ප්‍රකාශන සහ මුදල් ප්‍රවාහ ප්‍රකාශනය හා වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්ති සහ අනෙකුත් පැහැදිලි කිරීමේ තොරතුරුවල සාරාංශයකින් සමන්විත 2013 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 1998 අංක 5 දරන පනතින් සංශෝධිත (203 වන අධිකාරය වූ) මෝටර් වාහන පනතෙහි 213 "අ" වගන්තිය හා 237 වගන්තිය යටතේ පළකළ 2009 අප්‍රේල් 04 දිනැති රජයේ ගැසට් පත්‍රය සමග සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(3) ව්‍යවස්ථාවෙහි ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධිවිධාන යටතේ විගණනය කරන ලදී. යථෝක්ත මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මාගේ අදහස් දැක්වීම හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

### 1.2 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ වගකීම

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොර වූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

### 1.3 විගණකගේ වගකීම

මාගේ විගණනය මත පදනම්ව මෙම මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් මතයක් ප්‍රකාශ කිරීම මාගේ වගකීම වේ.මා විසින් උත්තරීතර විගණන ආයතනයන්ගේ ජාත්‍යන්තර විගණන ප්‍රමිතිවලට (ISSAI 1000 – 1810) අනුරූපව ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට අනුකූලව මාගේ විගණනය සිදු කරන ලදී. අචාර ධර්මවල අවශ්‍යතාවන්ට මම අනුකූලවන බවට සහ මූල්‍ය ප්‍රකාශන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොර වන්නේද යන්න පිළිබඳ සාධාරණ තහවුරුවක් ලබා ගැනීම පිණිස විගණනය සැලසුම්කර ක්‍රියාත්මක කරන බවට මෙම ප්‍රමිති අපේක්ෂා කරයි.

මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන අගයන් සහ හෙළිදරව් කිරීම්වලට උපකාරීවන විගණන සාක්ෂි ලබාගැනීම පිණිස පටිපාටි ක්‍රියාත්මක කිරීම විගණනයට ඇතුළත් වේ. තෝරාගත් පටිපාටීන්, වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් අවදානම් තක්සේරු කිරීම් විගණකගේ විනිශ්චය මත පදනම් වේ. එම අවදානම් තක්සේරු කිරීම්වලදී, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස සභාවේ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට සහ සාධාරණ ලෙස ඉදිරිපත් කිරීමට අදාළ වන්නා වූ අභ්‍යන්තර පාලනය විගණක සැලකිල්ලට ගන්නා නමුත් සභාවේ අභ්‍යන්තර පාලනයේ සඵලදායීත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමට අදහස් නොකරයි. කළමණාකරණය විසින් අනුගමනය කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය සහ යොදාගන්නා ලද ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය ඇගයීම මෙන්ම මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම පිළිබඳ ඇගයීමද විගණනයට ඇතුළත්වේ.

මාගේ විගණන මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි සහ උචිත බව මාගේ විශ්වාසයයි.

### 2. මූල්‍ය ප්‍රකාශන

**2.1 මතය**

මූල්‍ය ප්‍රකාශනවලින් 2013 දෙසැම්බර් 31 දිනට මාර්ග ආරක්ෂාව පිළිබඳ ජාතික සභාවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය හා මුදල් ප්‍රවාහ ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

**2.2 නීති, රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණ වලට අනුකූල නොවීම**

පහත දැක්වෙන නීති, රීති, රෙගුලාසිවලට හා කළමනාකරණ තීරණ යනාදියට අනුකූල නොවීම් නිරීක්ෂණය විය.

| නීති, රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණ වලට යොමුව | අනුකූල නොවීම |
| --- | --- |
| (අ) ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි | |
| (i) මුදල් රෙගුලාසි 135 | කාර්ය මණ්ඩලය සඳහා විධිමත් පරිදි මූල්‍ය බලතල පැවරීමක් සිදු කර නොතිබුණි. |
| (ii) මුදල් රෙගුලාසි 371(4) | සුළු මුදල් අග්‍රිමය වශයෙන් 2006 වසරේ ලබාදුන් රු.2,000 ක අත්තිකාරම් මුදල වසර 7 ක් ගත වී තිබුණද සමාලෝචිත වර්ෂය අවසානය දක්වා පියවීමට කටයුතු කර නොතිබුණි. |
| (iii) මුදල් රෙගුලාසි 756 හා 757 | සභාව විසින් සමාලෝචිත වර්ෂය සඳහා භාණ්ඩ සමීක්ෂණයක් සිදුකර එහි වාර්තාවල පිටපතක් විගණකාධිපති වෙත එවීමට කටයුතු කර නොතිබුණි. |
| (ආ) 1978 දෙසැම්බර් 19 දිනැති අංක 842 දරන භාණ්ඩාගාර චක්‍රලේඛය | මිලදී ගත් වත්කම් පිළිබඳ විස්තර, එම වත්කම් ලබාගත් දිනය, වටිනාකම හා වාර්ෂික ක්ෂය ප්‍රමාණය පිළිබඳ තොරතුරු ඇතුළත් ස්ථාවර වත්කම් ලේඛනයක පවත්වා ගෙන ගොස් නොතිබුණි. |
| (ඇ) 2006 අංක 10 දරන දේශීය ආදායම් පනත | දේශීය ආදායම් දෙපාර්තමේන්තුව විසින් මෙම සභාව ආදායම් බදු වලින් නිදහස් කර නොතිබුණු නමුත් ඉකුත් වර්ෂවල මෙන්ම සමාලෝචිත වර්ෂයේද බදු ගෙවීමේ අවශ්‍යතාවය හඳුනා ගෙන බදු ගෙවීමට කටයුතු කර නොතිබුණි. |

**3. මූල්‍ය සමාලෝචනය**

**මූල්‍ය ප්‍රතිඵල**

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව, සමාලෝචිත වර්ෂයේ සභාවේ මූල්‍ය ප්‍රතිඵලය රු.33,965,367 ක අතිරික්තයක් වූ අතර ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ අතිරික්තය රු. 27,061,203 ක් වූයෙන් සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රතිඵලයෙහි රු.6,904,164 ක වර්ධනයක් පෙන්නුම් කෙරුණි. සභාවේ ප්‍රධාන ආදායම් ප්‍රභවය වන රක්ෂණ සමාගම්වලින් ලැබෙන දායකත්වය පෙර වර්ෂය හා සැසඳීමේදී රු.1,439,166 කින් හා භාණ්ඩාගාර බිල්පත් පොළී අදායම රු.6,111,453 කින් වැඩිවීම මෙම වර්ධනයට ප්‍රධාන වශයෙන් බලපා තිබුණි.

**4. මෙහෙයුම් සමාලෝචනය**

**4.1 කාර්ය සාධනය**

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) මෙම සභාවේ ප්‍රධාන අරමුණු වන්නේ මාර්ග අනතුරු වලින් තොර සමාජයක් බිහි කිරීම වන අතර මෙම අරමුණ ඉටු කර ගැනීමේදී පහත කාර්යයන් සම්බන්ධයෙන් මාර්ග සංවර්ධන අධිකාරිය, ප්‍රවාහන අමාත්‍යාංශය, පොලිස් දෙපාර්තමේන්තුව වැනි ආයතන සමඟ මනා සම්බන්ධීකරණයක් පවත්වාගෙන ගිය බවට සාක්ෂි ඉදිරිපත් නොවීය.

(i) මාර්ග ආරක්ෂාව පිළිබඳ ව්‍යාපෘති සකස් කිරීම හා ක්‍රියාවට නැංවීම.
(ii) රාජ්‍ය සහ රාජ්‍ය නොවන සංවිධාන තුළ මාර්ග ආරක්ෂාව හා සම්බන්ධ කාර්යයන් සම්බන්ධීකරණය කිරීම.
(iii) මාර්ග ආරක්ෂාව පිළිබඳ කටයුතු සඳහා මූල්‍යමය හා වෙනත් සහය ලබාගැනීම.
(iv) මාර්ග ආරක්ෂාව හා සම්බන්ධිත ප්‍රතිපත්තීන් සහ ව්‍යාපෘති පිළිබඳව රජයට උපදෙස් දීම.
(v) සමාන ජාත්‍යන්තර ආයතන සමඟ සබඳතා පැවැත්වීම සහ පළපුරුද්ද පිළිබඳ දැනුම හුවමාරු කර ගැනීම.
(vi) සම්බන්ධිත විෂයයන් පිළිබඳ තොරතුරු රැස්කිරීම, පර්යේෂණ පැවැත්වීම සහ ක්ෂේත්‍ර පරීක්ෂණ පැවැත්වීම.
(vii) රථ වාහන අනතුරු, රථ වාහන ප්‍රමාණය හා ඒවායේ ලක්ෂණ හා සංයුතිය, මාර්ග ආරක්ෂාව පිළිබඳ දේශීය සහ ජාත්‍යන්තර සංඛ්‍යා ලේඛන පිළිබඳ දත්ත ගබඩාවක් පවත්වාගෙන යාම.

(ආ) 2004 දෙසැම්බර් මාසයේදී පිහිටුවා ඇති මෙම සභාවේ ප්‍රධාන අරමුණු අතර මාර්ග අනතුරු සිදු කර පලා යන හා හඳුනා නොගත් වාහන වලින් අනතුරට පත්ව මියගිය හෝ තුවාල ලත් පුද්ගලයින්ගේ යැපෙන්නන් හට මූල්‍ය සහන ලබාදීමයි. ඒ පිළිබඳ පරීක්ෂා කිරීමේදී සභාව ආරම්භ කළ වර්ෂයේ සිට 2013 වර්ෂය අවසාන වන විට ලැබුණ ඉල්ලුම්පත්‍ර 236 කින් ඉල්ලුම්පත් 148 ක් සඳහා රු.6,340,000 ක වන්දි මුදලක් ලෙස ගෙවා ඇති බව අනාවරණය විය. වන්දි මුදල් ලබා දුන් ඉල්ලුම් පත්‍ර වලින් 73 ක් සඳහා අදාළ සනාථ කිරීමේ සහතික ලබා දීමේදී ඇති වී තිබුණු ප්‍රමාද හේතුවෙන් එම වන්දි ගෙවීම් වසර 01 සිට 03 ක්වූ කාල ප්‍රමාදයක් නිරීක්ෂණය විය. සමාලෝචිත වර්ෂයේදී අරමුදලට රක්ෂණ සමාගම් වලින් රු.25,921,510 මුදලක් ලැබී තිබුණු අතර වන්දි ගෙවීමේ කාර්ය සඳහා වැය කර තිබුණේ රු.3,265,000 ක් හෙවත් සියයට 12.60 කට ආසන්න ප්‍රමාණයකි.

**4.2 කළමණාකරන අකාර්යක්ෂමතා**

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) 1998 අංක 05 දරණ මෝටර් රථවාහන පනතේ නියෝග අංක 02 ප්‍රකාරව රක්ෂණ ඔප්පුවක් හෝ ඇපයක් ප්‍රේෂණය කරන සෑම පුද්ගලයකු විසින්ම සියයට එකක දායක

මුදලක් සභාව වෙත එවිය යුතු වුවත්, සමාලෝචිත වර්ෂයේ රක්ෂණ සමාගම් 02 ක් විසින් එවිය යුතු දායක මුදලට වඩා රු. 6,621,988 ක් අඩුවෙන් ප්‍රේෂණය කර තිබුණු අතර, එම හිග මුදල් අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි. එයට හේතුව ලෙස සභාව විසින් විගණනයට ප්‍රකාශ කර තිබුණේ, "මෝටර් රථ පනතට කෙරෙන සංශෝධනයන් සහිතව මුළු රක්ෂණ ඔප්පු වාරික මත සියයට 1 ක දායකයක් අය කරන ලෙස පනත සංශෝධනය නොකිරීම නිසා, තෙවන පාර්ශව ඔප්පුවලින් සියයට 1 ක දායක ගණනය පහසු වුවත් පූර්ණ රක්ෂණ ඔප්පුවක වාරික තුළ ඇතුළත් තෙවන පාර්ශව දායක මුදල ගණනය කිරීමේ දුෂ්කරතා නිසා මෙම තත්ත්වය ඇති වූ බවයි. "

(ආ) 2004 පෙබරවාරි 24 දින අංක 1368/11 දරන ගැසට් නිවේදනයේ ආකෘති පත්‍ර අංක 01 ට අනුව සෑම රක්ෂණ සමාගමක්ම අයකරනු ලබන අදාල දායක මුදල් ඉදිරි මාසයේ 15 වන දින හෝ ඊට පෙර සභාව වෙත එවිය යුතු ලෙස සඳහන් කර තිබුණු නමුත්, සභාව විසින් එම දායක මුදල් ලබා ගැනීමට කටයුතු කර නොතිබුණි.

(ඇ) සභාවේ වාහන දෙකක් වෙනුවෙන් ලබාදුන් රු. 45,390 ක් වටිනා ඉන්ධන බිල්පත්වල එම වාහනවල ලියාපදිංචි අංකය හා තෙල් ලබාගත් දිනය ඇතුළත් කර නොතිබුණි.

**4.3 අරමුදල් ඌන උපයෝජනය**

සභාව සතු බැංකු ගිණුමේ ශේෂය සමාලෝචිත වර්ෂය ආරම්භයේ රු. මිලියන 6.0 ක් පැවති අතර, අවසානය වන විට එය රු. මිලියන 25.35 ක් දක්වා වැඩි වී තිබුණි. සභාවේ මෙහෙයුම් සඳහා ප්‍රමාණවත් මුදලක් තබාගෙන ඉතිරි අතිරේක අරමුදල් භාණ්ඩාගාර අනුමැතිය ලබා ගෙන ඵලදායි අයෝජනයක යොදවා නොතිබුණි.

**5. ගිණුම් කටයුතුභාවය හා යහපාලනය**

**5.1 ගිණුම් ඉදිරිපත් කිරීම**

2003 ජූනි 02 දිනැති අංක පීඊඩී 12 දරන රාජ්‍ය ව්‍යාපාර දෙපාර්තමේන්තු චක්‍රලේඛයේ 6.5.1 ඡේදය ප්‍රකාරව මුදල් වර්ෂය අවසාන වී දින 60 ක් ඇතුළත වාර්ෂික මූල්‍ය ප්‍රකාශන විගණනයට ඉදිරිපත් කළ යුතු වුවත්, සමාලෝචිත වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 2014 මාර්තු 14 දින විගණනයට ඉදිරිපත් කළද, පසුව කරන ලද සංශෝධන සහිත මූල්‍ය ප්‍රකාශන විගණනයට ඉදිරිපත් කරන ලද්දේ 2014 මැයි 31 දිනදීය.එනම් දින 92 ක ප්‍රමාදයකින් පසුවයි.

**5.2 සංයුක්ත සැලැස්ම හා ක්‍රියාකාරි සැලැස්ම**

2003 ජූනි 02 දිනැති අංක පීඊඩී 12 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛයේ 5.1.2 ඡේදය ප්‍රකාරව ආයතනයේ දර්ශනය හා මෙහෙවර සාක්ෂාත් කර ගැනීම සඳහා සංයුක්ත සැලැස්මක් හා ක්‍රියාකාරී සැලැස්මක් පිළියෙල කර තිබුණද ඒ සඳහා ප්‍රවාහන අමාත්‍යාංශයේ ලේකම්ගේ අනුමැතිය ලබා ගෙන නොතිබුණි.

**6. පද්ධති හා පාලනයන්**

විගණනයේදී නිරීක්ෂණය වූ පද්ධති හා පාලන ක්ෂේත්‍රයන් සම්බන්ධයෙන් නිරීක්ෂණය වූ විවිධ අඩුපාඩු වරින්වර සභාපතිවරයාගේ අවධානයට යොමුකරන ලදී. පහත සඳහන් ක්ෂේත්‍ර පිළිබඳ විශේෂ අවධානය යොමු කළ යුතු වේ.

(අ) ගිණුම්කරණය
(ආ) මූල්‍ය කළමනාකරණය

(ඇ) ආයෝජනය හා පොළී ගණනය කිරීම
(ඈ) රක්ෂණ සමාගම් වලින් ලැබෙන දායකය හඳුනා ගැනීමේ හා ප්‍රේෂණය කර ගැනීමේ ක්‍රමවේදය
(ඉ) වන්දි ගෙවීම්